# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1826/23 - 2013 සැප්තැම්බර් මස 04 වැනි බදාදා - 2013.09.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, විදුලි බල හා බල ශක්ති, මිනිස්බල හා රැකී රක්ෂා, ආර්ථික ප්‍රවර්ධන හා වෙළඳ කටයුතු පිළිබඳ අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මම, පහත උපලේඛනයෙහි විස්තර කරනු ලබන බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2013 අංක 01 දරන පෙර පාසල් ප්‍රඥප්තිය 2013.02.05 දින බස්නාහිර පළාත් සභාව විසින් සභා සම්මත කිරීමෙන් පසුව ඒ සඳහා 2013.07.04 දින බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමාගේ අනුඥාව ලබා දී ඇති බව මෙයින් නිවේදනය කරමි.

ප්‍රසන්න රණතුංග,
බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය,
මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන,
පළාත් පාලන හා පළාත් පරිපාලන, විදුලි බල හා බල ශක්ති,
මිනිස්බල හා රැකී රක්ෂා, ආර්ථික ප්‍රවර්ධන හා වෙළඳ කටයුතු පිළිබඳ අමාත්‍ය.

2013 අගෝස්තු මස 13 වැනි දින,
කොළඹ 07,
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ,
ශ්‍රාවස්ථි මන්දිරයේ පිහිටි බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍යාංශයේ දී ය.

බස්නාහිර පළාත් සභාවේ 2013 අංක 01 දරන
පෙර පාසල් ප්‍රඥප්තිය

බස්නාහිර පළාත තුළ පෙර පාසල් ලියාපදිංචි කිරීම, අධීක්ෂණය කිරීම, පරිපාලනය කිරීම හා මෙහෙයවීම සඳහා ද, ආදර්ශ පෙර පාසල් හඳුන්වාදීම සඳහා සහ ඊට ආනුශාංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද, 2003 අංක 04 දරන පෙර පාසල් ප්‍රඥප්තිය පරිච්ඡින්න කිරීම සඳහා ද වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ :- පැනවීම


1A - PG 001747 — 250 (2013/09)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

1. මෙම ප්‍රඥප්තිය බස්නාහිර පළාත් සභාවේ "2013 අංක 01 දරන පෙර පාසල් ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබූ දින සිට ක්‍රියාත්මක වේ.

**I වැනි කොටස**

*අරමුණු*

2. මෙම ප්‍රඥප්තියේ අරමුණු පහත සඳහන් පරිදි වේ.

අරමුණු

(1) පළාත තුළ පවත්වා ගෙන යන සියලුම පෙර පාසල් ලියාපදිංචි කිරීම, නියාමනය කිරීම හා අධීක්ෂණය කිරීම ;

(2) පළාතේ පෙර පාසල් සේවයේ නියුතු සියලුම ගුරුවරුන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනය කිරීම ;

(3) පළාතේ පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති තීරණය කිරීම සහ ක්‍රියාවට නැංවීම ;

(4) පෙර පාසල් සඳහා ප්‍රමිතීන් නියම කිරීම ;

(5) පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳව පෙර පාසල් දරුවන්ගේ දෙමාපියන් හා ප්‍රජාව දැනුවත් කිරීම ;

(6) පළාතේ පෙර පාසල් හා සම්බන්ධ කාර්යයන් හි යෙදෙන රාජ්‍ය, රාජ්‍ය නොවන හා පෞද්ගලික අංශයේ ආයතනවල කටයුතු සම්බන්ධීකරණය කිරීම හා පළාත් ප්‍රතිපත්තියට අනුකූලව ඒවා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මඟ පෙන්වීම හා සම්බන්ධීකරණ කටයුතු පවත්වා ගෙන යාම ;

(7) පළාතේ පෙර පාසල් තුළින් මුල් ළමා විය දරුවන්ගේ සමස්ත සංවර්ධනය ඉලක්ක කර ගත් ක්‍රියාමාර්ග තුළින් ඔවුන්ගේ නිපුණතා සංවර්ධනය කරමින් විධිමත් අධ්‍යාපනයට හුරු කිරීමට හැකි පසුබිමක් ගොඩ නඟා දීම ;

(8) දරුවන්ට මුල් ළමා විය සතුටින් හා විනෝදයෙන් ගත කිරීමට අවශ්‍ය වටපිටාව සකස් කර දීම ;

(9) ප්‍රදේශීයේ ජනතාවගේ කලා, ආගමික හා සංස්කෘතික අවශ්‍යතාවයන්ට ගරු කරමින් දරුවන්ට සහජීවන දිවි පැවැත්මකට අවශ්‍ය පසුබිම සලසා දීම ;

(10) "පළාත් පෙර පාසල් සංවර්ධන අරමුදල" නමින් පළාත් අරමුදලක් පිහිටුවීම.

**II වැනි කොටස**

***පරිපාලනය, අධීක්ෂණය හා කාර්යයන්***

පෙර පාසල් ඒකකය පිහිටුවීම

3. මෙහි මින් මතු "බස්නාහිර පළාත් පෙර පාසල් ඒකකය" නමින් හඳුන්වනු ලබන පෙර පාසල් ඒකකයක් මෙයින් පිහිටුවනු ලබන අතර එම ඒකකය පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ පැවතිය යුතුය.

පෙර පාසල් අධ්‍යක්ෂ පත් කිරීම

4. (1) පෙර පාසල් ඒකකයේ ප්‍රධානියා වශයෙන් අධ්‍යක්ෂවරයෙකු සිටිය යුතුය.

(2) එම අධ්‍යක්ෂවරයා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I පන්තියේ නිලධාරියෙකු විය යුතු අතර ලේකම්වරයා විසින් පත් කරනු ලැබිය යුතුය.

(3) පෙර පාසල් ඒකකයේ සියලු කටයුතු පරිපාලනය, අධීක්ෂණය හා මෙහෙයවීම අධ්‍යක්ෂවරයා විසින් සිදු කළ යුතුය.

(4) මේ ප්‍රඥප්තිය යටතේ වූ ස්වකීය බලතල, කාර්යය හෝ කර්තව්‍ය අතරින් කිසිවක් අධ්‍යක්ෂ විසින් යම් නිලධාරියෙකුට පැවරිය හැකිය.

පෙර පාසල් ඒකකයේ කාර්ය භාරය

(5) පෙර පාසල් ඒකකය මතු දැක්වෙන කාර්යයන් ඉටු කළ යුතුය :-

(1) පළාතේ, පෙර පාසල් නමින් හෝ වෙනත් ඕනෑම නමකින් හඳුන්වනු ලබන අවුරුදු 3-5 අතර දරුවන් සඳහා නියමිත ක්‍රියාකාරකම් වල යෙදෙන ආයතන ලියාපදිංචි කිරීම, අධීක්ෂණය හා නියාමනය ;

(2) පළාතේ පෙර පාසල් අධ්‍යාපන කටයුතු වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය මඟ පෙන්වීම සහ ආධාර ලබා දීම ;

(3) පෙර පාසල් වයසේ සිටින විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන් සඳහා අවශ්‍ය පහසුකම් හා සේවා සැලසීම ;

(4) පෙර පාසල් ගුරුවරියන් පුහුණු කිරීම සඳහා පුහුණු ආයතනයන් පවත්වගෙන යාම හා නිසි පුහුණුව ලැබූ අයට සහතිකපත් ප්‍රදානය කිරීම ;

(5) පෙර පාසල් අධ්‍යාපනය නවීකරණය හා යාවත්කාලීන කිරීමට අදාළ සේවාස්ථ පුහුණු සැසි හා පුහුණු වැඩමුළු පැවැත්වීම ;

(6) පළාතේ පෙර පාසල්, අදාළ ප්‍රමිතිය හා සපයන සේවා පහසුකම් සැලකිල්ලට ගෙන ශ්‍රේණිගත කිරීම ;

(7) පළාත තුළ රාජ්‍ය, පළාත් පාලන ආයතන හා විවිධ සංවිධාන විසින් පෞද්ගලික මට්ටමෙන් පවත්වා ගෙන යනු ලබන සියලුම පෙර පාසල් සඳහා පාලන හා කළමනාකරණ ප්‍රමිතීන් නියම කිරීම ;

(8) පළාතේ පෙර පාසල් ගුරු පුහුණු කටයුතු වල යෙදෙන ජාතික මට්ටමේ රාජ්‍ය ආයතන නොවන සියලුම පුහුණු ආයතනවල ප්‍රමිතිය පවත්වාගෙන යාමට මඟ පෙන්වීම හා නියාමනය ;

(9) පෙර පාසල් අධ්‍යාපනයේ වැදගත්කම පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීමට වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම.

## III වැනි කොටස

### *පෙර පාසල් උපදේශක කමිටුව*

6. පහත සඳහන් සාමජිකයන්ගෙන් සමන්විත මෙහි "උපදේශක කමිටුව" යනුවෙන් හඳුන්වනු ලබන පෙර පාසල් උපදේශක කමිටුවක් අමාත්‍යවරයා විසින් පත් කළ යුතුය. පෙර පාසල් උපදේශක කමිටුව

(1) පෙර පාසල් උපදේශක කමිටුව මෙහි මින්මතු නිල බලයෙන් පත් කරන සාමාජිකයන් ලෙස හඳුන්වනු ලබන : නිල බලයෙන් පත්වන සාමාජිකයන්

(අ) බස්නාහිර පළාතේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් හෝ ලේකම් විසින් නම් කරනු ලබන විධායක ශ්‍රේණියේ නිලධාරියෙක් ;
(ආ) බස්නාහිර පළාතේ අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ ඔහුගේ නියෝජිතයෙක් ;
(ඇ) බස්නාහිර පළාතේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ හෝ ඔහුගේ නියෝජිතයෙක් ;
(ඈ) බස්නාහිර පළාතේ පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස් හෝ ඔහුගේ නියෝජිතයෙක් ;
(ඉ) බස්නාහිර පළාතේ පළාත් පාලන කොමසාරිස් හෝ ඔහුගේ නියෝජිතයෙක් ;
(ඊ) අදාළ විෂයභාර අමාත්‍යාංශයේ නීති නිලධාරී.

යන තැනැත්තන්ගෙන් ; සහ

(2) වසර දහයකට වැඩි පලපුරුද්දක් සහිත බස්නාහිර පළාතේ ලියාපදිංචි පෙර පාසල් ගුරුවරියන් තිදෙනෙක් ද ඇතුළත්ව අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන විෂය ක්ෂේත්‍රය පිළිබඳ සුදුසුකම් ඇති පුද්ගලයන් පස්දෙනෙක් යන පත්කළ සාමාජිකයන්ගෙන් ද සමන්විත විය යුතුය. පත් කළ සාමාජිකයන්

7. (1) උපදේශක කමිටුවේ සභාපති පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් හෝ ඔහුගේ නියෝජිත විය යුතු අතර පෙර පාසල් අධ්‍යක්ෂ මෙම කමිටුවේ ලේකම් විය යුතුය. පෙර පාසල් උපදේශක කමිටුවේ සභාපති හා ලේකම්

(2) පත්කළ සාමාජිකයෙකු මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ධූරයෙන් ඉවත් කරනු ලැබීමෙන් කලින් ධූරය අත්හලහොත් මිස වසර තුනක කාලයක් ධූරය දැරිය යුතුය.

(3) උපදේශක කමිටුවේ රැස්වීමේ ගණපූරණය සාමාජිකයක් පස්දෙනෙකු විය යුතුය.

(4) උපදේශක කමිටුව සෑහීමකට පත් නොවන හේතුවක් මත පත්කළ සාමාජිකයෙකු නොදන්වා සභාවේ රැස්වීම් වාර තුනකට පිට පිටම සහභාගී නොවුවහොත් එම සාමාජිකයා ධූරය අත්හැර ගිය අයෙකු ලෙස සලකනු ලැබිය යුතුය.

(5) අමාත්‍යවරයා විසින් ඕනෑම අවස්ථාවක හේතු දක්වා උපදේශක කමිටුවේ පත්කළ සාමාජිකයෙකු ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකිය.

(6) පත්කළ සාමාජිකයෙකු විසින් තමා ධූරයෙන් ඉල්ලා අස්වන බවට අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ස්වකීය ධූරයෙන් ඉල්ලා අස්විය හැකිය.

(7) පත්කළ සාමාජිකයෙකු මිය යෑමෙන්, ඉල්ලා අස්වීමෙන්, ධුරයෙන් ඉවත් කරනු ලැබීමෙන් හෝ අන්‍ය ආකාරයකින් ධුරය හිස්වන අවස්ථාවක අමාත්‍යවරයා විසින් 06(2) උපවගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගෙන ඒ සාමාජිකයාගේ අනුප්‍රාප්තිකයා වශයෙන් වෙනත් තැනැත්තෙකු පත් කළ යුතුය. එම සාමාජිකයා වෙනුවට පත් කරනු ලැබූ යම් අනුප්‍රාප්තිකයෙකු විසින් තම පූර්වගාමියාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධුරය දැරිය යුතුය.

(8) ඉහත (5) උපවගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබූ සාමාජිකයෙකු හැර පත් කළ සාමාජිකයෙකු නැවත පත් කරනු ලැබීම සඳහා සුදුස්සකු වන්නේය.

(9) උපදේශක කමිටුව අවම වශයෙන් මාස තුනකට වරක් වත් රැස්විය යුතුය.

(10) මුදල් විෂයභාර පළාත් සභා අමාත්‍යවරයාගේ එකඟතාවය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන දීමනාවක් සෑම උපදේශක කමිටු සැසිවාරයක් සඳහා ඊට සහභාගී වන සාමාජිකයන්ට ගෙවනු ලැබිය හැකිය.

උපදේශක කමිටුවට පත්වීමට නුසුදුසුකම්

08. යම් තැනැත්තෙක් :-

(1) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු නොවේ නම් හෝ පුරවැසිභාවය අහෝසි වුවහොත් ;
(2) සිහිවිකල් භාවයට හෝ උන්මන්තක භාවයට පත් වුවහොත් ;
(3) වස්තු භංගත්වයට පත් වුවහොත් ;
(4) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් රටක අපරාධමය අධිකරණයක් විසින් නිකුත් කරන ලද තීන්දුවක් මත බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් නියම කර ඇත් නම් හෝ විඳිනම් හෝ විඳ ඇත්නම් ;
(5) උපදේශක කමිටුවේ කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීමේදී හානිකර ලෙස බලපෑමට ඉඩ තිබෙන මූල්‍යමය සම්බන්ධතාවයක් දරයි නම් ;
(6) මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු කරනු ලැබූවහොත්.

උපදේශක කමිටුවේ සාමාජිකයෙකු ලෙස පත් කිරීමට හෝ කටයුතු කරගෙන යාමට හෝ නුසුදුස්සකු වන්නේය.

09. උපදේශක කමිටුවේ පුරප්පාඩුවක් හෝ සාමාජිකයෙකු පත් කිරීමේ අඩුපාඩුවක් හේතු කොට ගෙන එමගින් ගනු ලබන තීරණයක් හෝ ගනු ලබන ක්‍රියාවක් අවලංගු නොවිය යුතුය.

උපදේශක කමිටුවේ කාර්යයන් හා කර්තව්‍යයන්

10. උපදේශක කමිටුව විසින් පහත දැක්වෙන කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කළ යුතුය.

(1) පළාතේ පෙර පාසල් ලියාපදිංචි කිරීම, නියාමනය කිරීම හා අධීක්ෂණය කිරීම සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සකස් කිරීමට උපදෙස් දීම.
(2) පෙර පාසල් ඒකකයට අවශ්‍ය උපදෙස් ලබා දීම හා මග පෙන්වීම.
(3) මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම පිළිබඳව අවශ්‍ය අවස්ථාවලදී අධ්‍යක්ෂවරයා වෙත උපදෙස් නිකුත් කිරීම.
(4) සියලුම පෙර පාසල් සඳහා භාවිතා කළ යුතු විෂය මාලාවක් ජාතික අධ්‍යාපන ආයතනයේ මඟ පෙන්වීමට අනුකූලව සකස් කිරීමට සහ සියලුම පෙර පාසල් වල ක්‍රියාත්මක කිරීමට උපදෙස් දීම.

## IV වැනි කොටස

### *පෙර පාසල් සංවර්ධන අරමුදල*

පෙර පාසල් සංවර්ධන අරමුදල

11. බස්නාහිර පළාතේ පෙර පාසල් සංවර්ධන අරමුදල යනුවෙන් අරමුදලක් පිහිටුවිය යුතුය.

(1) අරමුදලේ පාලන කටයුතු සම්බන්ධයෙන් පාලක මණ්ඩලයක් පත් කළ යුතු අතර එය පහත දැක්වෙන නිලධාරීන්ගෙන් සමන්විත විය යුතුය :

(අ) ලේකම්වරයා විසින් පත් කරනු ලබන ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් ;

(ආ) ප්‍රධාන ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ (ගිණුම් හා ගෙවීම්) ;

(ඇ) අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ (සංවර්ධන) ;

(ඈ) ප්‍රාථමික විෂයභාර පළාත් සම්බන්ධීකරණ අධ්‍යක්ෂ ;

(ඉ) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී.

(2) ලේකම්වරයා විසින් පත් කරන ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් මෙම පාලක මණ්ඩලයේ සභාපති විය යුතුය.

(3) පළාත් සභාව විසින් වරින් වර ලබා දෙන සියලු මුදල් සහ පෙර පාසල් ඒකකය මගින් උපයා ගන්නා සියලු මුදල් ද, වෙනත් ආධාර හා ප්‍රදානයන් ද මෙම අරමුදලට බැර කළ යුතුය.

(4) මෙම ප්‍රඥප්තියේ අරමුණු මුදූන් පත් කර ගැනීම සඳහා දරනු ලබන වියදම් මෙම අරමුදලෙන් ගෙවිය හැකිය.

(5) අරමුදලේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන අදාළ විය යුතුය. ගිණුම් විගණනය

### V වැනි කොටස

#### *පෙර පාසල් සඳහා ප්‍රමිතීන්*

12. (1) පෙර පාසල් අවම වශයෙන් පහත මූලික හා අවම පහසුකම් වලින් සමන්විත විය යුතුය. පෙර පාසල් වල තිබිය යුතු මූලික හා අවම පහසුකම්

(අ) එක් දරුවකු සඳහා අවම වශයෙන් වර්ග අඩි දහයක ගොඩනැගිලි ඉඩකඩ වෙන් කර තිබීම ;
(ආ) ළමුන් විසි පහකට එක් වැසිකිළියක් බැගින් වැසිකිළි පද්ධතියක් සකස් කර තිබීම ;
(ඇ) ගොඩනැගිල්ලේ කාමර වර්ග ප්‍රමාණයෙන් 1/7 ක් වන පරිදි වාතාශ්‍රය සැපයෙන ආකාරයට සකස් කර තිබීම ;
(ඈ) ආරක්ෂිත තාප්පයකින් හෝ ආරක්ෂිත වැටකින් පෙර පාසල් භූමිය මැනවින් ආරක්ෂා කර තිබීම ;
(ඉ) අවශ්‍ය උපකරණ හා බෙහෙත් සහිත ප්‍රථමාධාර පෙට්ටියක් පවත්වා ගෙන යාම ;
(ඊ) ක්‍රීඩා කිරීම සඳහා පහසුකම් තිබීම ;
(උ) පෙර පාසල් භූමිය ප්‍රසන්න පරිසරයකින් සකස් කර තිබීම හා මූලික ක්‍රීඩා උපරකණ වලින් සමන්විත වී තිබීම ;
(ඌ) දරුවන් සඳහා 20 : 1 අනුපාතයට ලියාපදිංචි ගුරුවරියන් යොදා ගෙන තිබීම ;
(එ) ප්‍රමාණවත් ලී බඩු උපකරණ තිබීම සහ ඒවා දරුවන්ගේ මානසික ප්‍රබෝධයට ඉවහල් වන ආකාරයට ප්‍රසන්න පෙනුමකින් පවත්වා ගෙන යාම ;
(ඒ) ආගමික වතාවත් කිරීමට සුදුසු ස්ථානයන් සකස් කර තිබීම.

(2) හානිකර හෝ අන්තරාදායක පරිසරයක් තුළ හෝ එවන් ස්ථානයක සිට මීටර් 100ක් ඇතුළත ප්‍රදේශය තුළ හෝ පෙර පාසලක් ස්ථාපනය නොකළ යුතුය.

### **VI** වැනි කොටස

#### *පෙර පාසල් ලියාපදිංචි කිරීම*

13. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දින සිට පළාත තුළ ලියාපදිංචි කරනු නොලැබූ පෙර පාසලක් පවත්වා ගෙන යාම නොකළ යුතුය. ලියාපදිංචි කළ යුතු බව

14. (1) 2003 අංක 4 දරන පෙර පාසල් ප්‍රඥප්තිය යටතේ දැනටමත් ලියාපදිංචි කර ඇති පෙර පාසලක් නැවත ලියාපදිංචි කිරීම අවශ්‍ය නොවන අතර ලියාපදිංචි නොකළ පෙර පාසලක් මෙම ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කිරීම සඳහා මාස හතරක සහන කාලයක් ලබා දෙනු ලැබේ. ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කළ යුතු බව

(2) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව අළුතින් ආරම්භ කරන පෙර පාසලක් පිහිටුවා මාස හතරක් ඇතුළත ලියාපදිංචි කිරීම කළ යුතුය.

15. ඉහත 14(1), (2) උපවගන්ති යටතේ ලියාපදිංචි කිරීමට අපොහොසත් වූ කිසියම් පෙර පාසලක් මාස හය (6)ක් ඇතුළත යුක්ති සහගත හා සාධාරණ හේතු සහිතව ලියාපදිංචිය සඳහා ඉල්ලීමක් කළහොත් ඉකුත් වූ කාලයට අමතර ගාස්තුවක් ලෙස ලියාපදිංචි ගාස්තුවට අමතරව 50% ක දඩ මුදලක් ද සහිතව ලියාපදිංචි කිරීමට අධ්‍යක්ෂවරයාට බලය ඇත්තේය.

16. ලියාපදිංචි වීම සඳහා අයදුම්කරු විසින් නියමිත ලියාපදිංචි ගාස්තුව ගෙවිය යුතුය.

17. මෙම ප්‍රඥප්තියේ විධිවිධාන කඩ කරමින් පෙර පාසලක් ආරම්භ කරන හෝ පෙර පාසලක් පවත්වා ගෙන යනු ලබන තැනැත්තෙකු මෙම ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන්නේය.

ලියාපදිංචිය ප්‍රතික්ෂේප කිරීමට අධ්‍යක්ෂකට ඇති බලය.

18. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනය වන විට පෙර පාසල් නමින් හෝ වෙනත් නමකින් පවත්වා ගෙන යනු ලබන කිසියම් ආයතනයක් ප්‍රඥප්තියේ විධිවිධාන පරිදි ලියාපදිංචි කිරීම සඳහා ව්‍යවසායකයා විසින් අධ්‍යක්ෂවරයා වෙත ලිඛිත ඉල්ලීමක් කරනු ලැබූ විට එම ඉල්ලීම මෙම ප්‍රඥප්තියේ විධිවිධාන වලට අනුකූල නොවේ නම්, අධ්‍යක්ෂවරයා විසින් ඒ පිළිබඳ හේතු දක්වා ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කළ හැකිය.

(1) එවැනි ඉල්ලීමක් කරනු ලබන සෑම අවස්ථාවකදීම එසේ ප්‍රතික්ෂේප කිරීමට හේතුව ඉල්ලීම කරනු ලැබූ දින සිට ලිත් මාසයක් ඇතුළත එම ඉල්ලීම කරනු ලැබූ ව්‍යවසායකයාට දැන්විය යුතුය.

(2) එවැනි ප්‍රතික්ෂේප කිරීමක් සිදු වූ අවස්ථාවකදී එකී ව්‍යවසායකයා විසින් ඒ සම්බන්ධයෙන් ලිත් මසක් ඇතුළත විෂයභාර අමාත්‍යවරයා වෙත අභියාචනාවක් කළ හැකිය.

(3) එවැනි අභියාචනයක් ලද විට අමාත්‍යවරයා එය උපදේශක කමිටුවට යොමු කර නිරීක්ෂණ හා නිර්දේශ ලබා ගෙන ලිත් මාස තුනක් ඇතුළත තම තීරණය අභියාචක වෙත ලබා දිය යුතුය.

(4) මේ සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් ගනු ලබන තීරණ අවසානාත්මක හා තීරණාත්මක වන්නේය.

ලියාපදිංචි පෙර පාසල් ලේඛනයක් පවත්වාගෙන යා යුතු බව.

19. (1) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දින වන විට පෙර පාසලක් වශයෙන් පවත්වා ගෙන ගොස් මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනෙන් පසු ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුව ලියාපදිංචි කරන ලද්දා වූ ද ප්‍රඥප්තියේ ක්‍රියාත්මක වන දිනයෙන් පසු ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුව අලුතින් පිහිටුවා ලියාපදිංචි කරන ලද්දා වූ ද පෙර පාසල් සම්බන්ධ ලේඛනයක් පෙර පාසල් අධ්‍යක්ෂ විසින් පවත්වා ගෙන යා යුතුය.

(2) ලියාපදිංචි සෑම පෙර පාසලකටම අධ්‍යක්ෂවරයා විසින් අංකයක් සහ සහතිකයක් ලබා දිය යුතුය.

(3) ලියාපදිංචි කරන ලද පෙර පාසලක් ප්‍රඥප්තියේ විධිවිධාන අනුව පවත්වා ගෙන නොයන්නේ නම් එවැනි පෙර පාසලක ලියාපදිංචිය අවලංගු කිරීමට අධ්‍යක්ෂවරයාට බලය ඇත්තේය.

පෙර පාසල් ලියාපදිංචිය අවලංගු කිරීම.

(4) ලියාපදිංචි කරන ලද පෙර පාසලක ව්‍යවසායකයා පෙර පාසල් සම්බන්ධ කටයුත්තකදී අධිකරණයක් විසින් දෙන ලද තීන්දුවක් මත වරදකට වරදකරු කර තිබේ නම් එවැනි පෙර පාසලක ලියාපදිංචිය අවලංගු කිරීමට අධ්‍යක්ෂවරය ට බලය ඇත්තේය.

## VII වැනි කොටස

### *පෙර පාසල් ගුරුවරියන් ලියාපදිංචි කිරීම*

පෙර පාසල් ගුරුවරියන්ගේ අධ්‍යාපන සුදුසුකම්.

20. 2003 අංක 04 දරන පෙර පාසල් ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීමට පෙර සිට සේවය කරනු ලැබ දැනට ලියාපදිංචි වී ඇති පෙර පාසල් ගුරුවරියන් හැර මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක දින වන විට පෙර පාසල් ගුරුවරියන් ලෙස කටයුතු කරන තැනැත්තන් සහ පෙර පාසල් ගුරුවරියන් ලෙස කටයුතු කිරීමට අපේක්ෂා කරන තැනැත්තන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් මව් භාෂාවට සම්මාන සහිතව ගණිතය ඇතුළු විෂයයන් හයකින් සමත් වීම සහ උපදේශක කමිටුව විසින් පිළිගත් ආයතනයක ඩිප්ලෝමාවක් ලබා තිබිය යුතුය. අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ මව් භාෂාවට සම්මාන සහිතව ගණිතය ඇතුළු විෂයන් හයකින් සමත් වී අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයෙන් විෂයයන් තුනකින් එකවර සමත්ව ඇත්නම් උපදේශක කමිටුව පිළිගත් පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ පුහුණු පාඨමාලාවක් හදාරා තිබිය යුතුය.

එසේ වුවද, මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දින විට වසර 10 කට වඩා වැඩි සේවා කාලයක් සහිතව සේවයේ යෙදෙමින් සිටින ඉහත මූලික සුදුසුකම් සපුරා නොමැති දැනට ලියාපදිංචි වී නොමැති පෙර පාසල් ගුරුවරියන් උපදේශක කමිටුව විසින් පවත්වනු ලබන විභාගයකින් සමත් විය යුතුය.

පෙර පාසල් ගුරුවරියන් ලියාපදිංචි විය යුතු බව.

21. (1) ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කරන තැනැත්තන් ප්‍රඥප්තියේ විධිවිධාන ප්‍රකාරව සුදුසුකම් සපුරා ඇත්නම් ලියාපදිංචි කළ යුතු අතර හැඳුනුම්පතක් ද නිකුත් කළ යුතුය.

පෙර පාසල් ගුරුවරියන්ගේ ලියාපදිංචිය අවලංගු කිරීම.

(2) පෙර පාසල් ගුරුවරියක ලෙස ලියාපදිංචි වී ඇති තැනැත්තෙකු ප්‍රඥප්තියේ විධිවිධාන අනුව සුදුසුකම් සපුරා නොමැති නම් හෝ අධිකරණයක් විසින් දෙන ලද තීන්දුවක් මත අපරාධ වරදකට වරදකරු කර තිබේ නම් එම පෙර පාසල් ගුරුවරියගේ ලියාපදිංචිය අවලංගු කිරීමට අධ්‍යක්ෂවරයාට බලය ඇත්තේය.

(3) ලියාපදිංචි වීම සඳහා පෙර පාසල් ගුරුවරියන් විසින් නියමිත ගාස්තුවක් ගෙවිය යුතුය.

VIII වැනි කොටස

*වැරදි හා දණ්ඩන*

22. (1) (අ) මෙම ප්‍රඥප්තියේ විධිවිධාන හෝ ප්‍රඥප්තිය යටතේ සම්පාදනය කළ රීති හෝ උල්ලංඝණය කිරීම, කඩ කිරීම සිදු කරන යම් තැනැත්තෙකු ;

(ආ) මෙම ප්‍රඥප්තිය යටතේ රාජකාරි ඉටු කරනු ලබන නිළධාරියෙකුගේ රාජකාරියට බාධා කිරීම, අවහිර කිරීම සිදු කරන යම් තැනැත්තෙකු ;

(ඇ) ඉහත (අ) (ආ) සඳහන් වැරදි සඳහා පෙළඹවීම, අනුබල දීම සිදු කරන තැනැත්තෙකු. ;

මෙම ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන්නේය.

(2) ඉහත (1) උපවගන්තියට අනුව යම් වරදකට වරදකරු වන තැනැත්තෙකු මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට රුපියල් දහදාහ (රු. 10,000/-) කට නොඅඩු හා රුපියල් පනස්දාහ (රු. 50,000/-) කට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඬුවම් දෙකටම හෝ යටත් විය යුතුය.

(3) ඉහත (2) උපවගන්තියේ සඳහන් දණ්ඩනවලට අතිරේකව මෙම ප්‍රඥප්තියේ 19 (3), (4) උපවගන්තිය යටතේ ලියාපදිංචිය අවලංගු කරන ලද පෙර පාසලක් වසා දැමීම සඳහා මහේස්ත්‍රාත්වරයා විසින් නියෝග කරනු ලැබිය හැක්කේය.

(4) ඉහත (2) උපවගන්තියේ සඳහන් දණ්ඩනවලට අතිරේකව මෙම ප්‍රඥප්තියේ 14 (1), (2) උපවගන්ති යටතේ ලියාපදිංචි නොකර පවත්වා ගෙන යනු ලබන පෙර පාසලක් වසා දැමීම සඳහා මහේස්ත්‍රාත්වරයා විසින් නියෝග කරනු ලැබිය හැක්කේය.

23. (1) මෙම ප්‍රඥප්තියට බස්නාහිර පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමතය ලැබූ දින සිට බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2003 අංක 04 දරන පෙර පාසල් ප්‍රඥප්තිය මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ. අන්තර්කාලීන විධිවිධාන

(2) එසේ වුවද 2003 අංක 04 දරන පෙර පාසල් ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරන ලද පෙර පාසල් හා පෙර පාසල් ගුරුවරියන් මෙම ප්‍රඥප්තිය යටතේ ද ලියාපදිංචි කරන ලද පෙර පාසල් හා පෙර පාසල් ගුරුවරියන් ලෙස සැලකිය යුත්තේය.

(3) 2003 අංක 04 දරන පෙර පාසල් ප්‍රඥප්තිය යටතේ ඉටු කරනු ලැබූ කාර්යයන් මෙම ප්‍රඥප්තිය යටතේ ඉටු කරනු ලැබූ කාර්යයන් ලෙස සැලකිය යුත්තේය.

IX වැනි කොටස

*පොදු විධිවිධාන*

24. (1) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ප්‍රඥප්තියේ සඳහන් විධිවිධානයන්ට අදාළව ඉහත 02 (3) (4), (6) (10), 05, 11 (3) (4), 12 (1) (2), 16, 19 (2), 21 (3) වගන්ති සම්බන්ධයෙන් රීති සෑදීමට අමාත්‍යවරයාට බලය ඇත්තේය.

(අ) එම සෑම රීතියක්ම *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු අතර එය පළ කළ දින සිට හෝ රීතියේ නියමිතව සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනක සිට හෝ ක්‍රියාත්මක විය යුතුය.

(ආ) එය *ගැසට් පත්‍රයේ* පළ කිරීමෙන් පසු මාස තුනක් ඇතුළත අනුමැතිය සඳහා පළාත් සභාවට ඉදිරිපත් කළ යුතු අතර පළාත් සභාව මඟින් අනුමත නොකළ යම් රීතියක් අනුමැතිය නොලද දිනයේ සිට එකී රීතිය යටතේ කලින් කරන ලද ක්‍රියාවකට හානියක් නොවන පරිදි පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතුය.

(2) මෙම වගන්තිය යටතේ සාදන ලද කිසිම රීතියක් පළාත් සභාව විසින් අනුමත කරන තුරු සහ ඒ අනුමැතිය *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන තුරු වලංගු නොවන්නේය.

අර්ථ නිරූපණය.

25. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම ප්‍රඥප්තියෙහි :

"පළාත් සභාව" යන්නෙන් බස්නාහිර පළාත් සභාව ද ;

"අමාත්‍යවරයා" යන්නෙන් අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරයාද ;

"ලේකම්" යන්නෙන් අධ්‍යාපන විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් ද ;

"අධ්‍යක්ෂවරයා" යන්නෙන් මෙම ප්‍රඥප්තිය යටතේ කටයුතු කිරීමට පත් කර ඇති නිසි බලධරයා ද ;

"පෙර පාසල" යන්නෙන් පළාත තුළ අවුරුදු තුන සිට පහ අතර මුල් ළමාවිය දරුවන්ගේ සංවර්ධනය සඳහා නියමිත ක්‍රියාකාරකම් යොදා ගනිමින් කටයුතු කරන ඕනෑම ආයතනයක් ද ;

"නියමිත ක්‍රියාකාරකම්" යන්නෙන් මුල් ළමාවිය දරුවාගේ සමස්ථ සංවර්ධනයට අදාළ කායික, මානසික, චිත්තවේග, සමාජීයීය, භාෂා, පරිසර නිපුණතා හා සෞන්දර්යය, හසුරු කුසලතා සහ යහජීවන පුරුදු යන අංශවල සංවර්ධනයට උචිත ක්‍රියාකාරකම්වල යෙදවීම ද ;

"උපදේශක කමිටුව" යන්නෙන් පෙර පාසල් උපදේශක කමිටුව ද ;

"ව්‍යවසායකයා" යන්නෙන් පෙර පාසලක් ආරම්භ කර පවත්වා ගෙන යනු ලබන ඕනෑම පුද්ගලයෙකු හෝ ආයතනයක් ද ;

"පෙර පාසල් ගුරුවරිය" යන්නෙන් පෙර පාසල් ගුරුවරියක් ලෙස ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි වී ඇති තැනැත්තියක් ද ;

"විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන්" යන්නෙන් පෙර පාසල් වයසේ සිටින වෛද්‍ය නිර්දේශයකින් සනාථ කරනු ලබන කායික හා/හෝ මානසික ආබාධිත තත්ත්වයේ පසුවන දරුවන් ද ;

"තැනැත්තෙකු" යන්නෙන් පෙර පාසලක් පවත්වා ගෙන යනු ලබන පුද්ගලයෙකු හෝ ව්‍යවසායකුයෙකු හෝ ස්වෙච්ඡා සංවිධානයක් හෝ සංස්ථාගත ආයතනයක් හෝ පෙර පාසලක සේවය කරනු ලබන ගුරුවරියක හෝ කාර්යය මණ්ඩලයේ යම් සේවකයෙකු හෝ බාහිර පුද්ගලයෙකු හෝ පුද්ගලයන් ද ;

"මූලික ක්‍රීඩා උපකරණ" යන්නෙන් නැගීම, එල්ලීම, ඉපිලීම, පැද්දීම, ලිස්සීම, රිංගීම, සහ විසි කිරීම යන ක්‍රියාකාරකම් සඳහා යොදා ගනු ලබන උපකරණයන් ද ;

"හානිකර හෝ අන්තරාදායක ස්ථාන" යන්නෙන් පෙර පාසලක් පිහිටි භූමියේ සිට ඉතා ආසන්නයෙන් මත්පැන් ශාලා හෝ අලෙවි සැල්, සිනමා ශාලා, වීඩියෝ දර්ශන ශාලා, අවමංගල්‍ය ශාලා, මස් මාංශ වෙළෙඳ සැල්, අනාරක්ෂිත කර්මාන්ත ශාලා, අපද්‍රව්‍ය රැස් කරන ස්ථාන, අධික ශබ්ද හෝ වායු දූෂණයට ලක් වන ස්ථාන, විසකුරු සතුන් ගැවසිය හැකි ස්ථාන, විවෘත ළිං, පොකුණු, ඇල දොළ, ගංගා, වැව් හෝ අනතුරුදායක බැවුම් පිහිටි ස්ථානයන් ද ;

අදහස් වේ.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

26. මෙම ප්‍රඥප්තියේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට එකී සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

09 - 605

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.